# ආරක්ෂක සේවය සැපයීමේ කොන්ත්‍රාත්තු ගිවිසුම

එක් පාර්ශවයකට මෙහි මින් පසු පළමු පාර්ශවය යැයි කියනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පී.එන්.කේ.මලලසේකර යන අය හා ඔහුගෙන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත් වන අය ද, අනෙක් පාර්ශවයට කොන්ත්‍රාත්කරු යයි කියනු ලබන ..........................................................................................හි පිහිටි ..............................................................................................ආයතනයෙහි සභාපති, ........................................................අය ද ඔහුගේ ඇවෑමෙන් එම තනතුරට පත්වන අය ද, එකී සමාගම හා එම සමාගමේ අනුප්‍රාප්තිකයින් දෙවන පාර්ශවයට ද, බැදි එකී දෙපාර්ශවය අතර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, ගබඩාව හා නඩත්තු අංශය පිහිටි පරිශ්‍රය, තාක්ෂණික වෘත්තිකයන් පුහුණු කිරීමේ ආයතනය, මරදාන, ගාල්ල අනුරාධපුර, මහනුවර, රත්නපුර, කුරුණෑගල, යාපනය, බදුල්ල, අම්පාර යන තාක්ෂණ විද්‍යාල සහ ඇඹිලිපිටිය,ආනමඩුව,බලපිටිය,බණ්ඩාරවෙල,මඩකලපුව,බෙලිඅත්ත,ගම්පහ,හෝමාගම,කළුතර, කෑගල්ල,කුලියාපිටිය,මන්නාරම,නුවරඑළිය,රත්මලාන,සම්මන්තුරේ,ත්‍රිකුණාමලය සහ මාතර යන කාර්මික විද්‍යාලයන්හි දේපල සහ පරිශ්‍රයන් ආරක්ෂා කිරීම සඳහා වූ පෞද්ගලික ආරක්ෂක සේවය සැපයීම සඳහා පහත සඳහන් ගිවිසුම හා කොන්දේසිවලට යටත්ව 2018.01.01 සිට 2018.12.31 දක්වා වූ කාලය තුළ ආරක්ෂක සේවා කටයුතු සම්බන්ධයෙන් වර්ෂ 2018 ක් වූ ජනවාරි මස . . . . . වන දින කොළඹ 10, ඕල්කට් මාවතේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ලියා අත්සන් කරන ලද ගිවිසුමයි.

ඉහත කී ගිවිසුම හා කොන්දේසි කවරේද යත්,

01. කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම වර්ෂයකට බදු රහිතව රුපියල් ......................................දහසක් (රු. ....................................) වේ. මෙම කොන්ත්‍රාත් මුදල සේවා මුරවල රාජකාරි කරන පැය ගණන සහ යොදවනු ලබන සේවක සංඛ්‍යාව අනුව වෙනස් විය හැකි ය.

02. කොන්ත්‍රාත්කරු විසින් මෙහි පහත උපලේඛනයේ සඳහන් කොන්දේසි හා උපදෙස් පරිදි එකී උපලේඛනයේ සඳහන් කර ඇති සේවාවන් 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලය තුළ සාර්ථකව ඉටු කළ යුතු වේ.

02.1 සේවය අසතුටුදායක නම් හෝ වෙනත් සාධාරණ හේතූන් මත ඕනෑම වේලාවක පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවයට මාසයක පූර්ව දැනුම් දීමකින් පසුව සේවය අවසන් කළ හැකිය.

03. පළමු පාර්ශවය විසින් තීරණය කරනු ලබන ඇප මුදලක් තැන්පත් කිරීමට දෙවන පාර්ශවය එකඟ විය යුතුය.

04. අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය පවරන ලද නම් කරනු ලබන නිලධාරියෙකුගේ උපදෙස් පරිදි කොන්ත්‍රාත්කරු විසින් සේවාවන් ඉටු කළ යුතුය.

05. ගෙවීම් කටයුතු මෙහි පහත උපලේඛනයේ ' ඉ ' වන ඡේදය අනුව සිදු කරනු ඇත.

06. කොන්ත්‍රාත්තුවට අදාළ සේවා සැපයීමේ දී දෙවන පාර්ශවයේ නොසැලකිල්ල නිසා හෝ තම රාජකාරිය පැහැර හැරීමක් නිසා හෝ රජයේ දේපලක් අස්ථානගත වුවහොත් සහ රජයේ දේපලකට යම් හානියක් සිදු වුවහොත් එම අලාභ වූ දේපලෙහි වටිනාකම දෙපාර්තමේන්තුවට ගෙවීමට දෙවන පාර්ශවය වන කොන්ත්‍රාත්කරු බැඳී සිටිය යුතු ය.

07. ගිවිසුමට පටහැනිව කටයුතු කළහොත් කොන්ත්‍රාත්කරුගේ සේවය ලබා ගැනීම නතර කිරීමට පළමු පාර්ශවය වන අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

08. කොන්ත්‍රාත්කරුගේ යම් සේවකයකු විසින් හෝ සේවකයකු වෙනුවෙන් හෝ කම්කරු වන්දි ආඥා පනතේ හෝ වෙනයම් කම්කරු නීතියක් යටතේ කරනු ලබන ඕනෑම ඉල්ලීමක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකීම දැරිය යුතුය. පළමු පාර්ශවය ඒ සම්බන්ධයෙන් වගකීමක් දැරීමට බැඳී නොසිටී.

09. කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලබන සේවාවන් සතුටුදායක නොවන බව විධිමත් පරීක්ෂණයකින් පසුව අධ්‍යක්ෂ ජනරාල් විසින් නිගමනය කරනු ලබන්නේ නම් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව කොන්ත්‍රාත්තුව ඕනෑම වේලාවක අවසන් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත. කොන්ත්‍රාත්කරු වෙත ලේඛනගත තැපැලෙන් ඒ බව දැන්වීම ප්‍රමාණවත් වේ.

10. කොන්ත්‍රාත්කරු විසින් මෙම ගිවිසුම නිසි පරිදි ඉටු කරන බවටත් මෙම කොන්ත්‍රාත්තුව යටතේ තමා විසින් රජයට ගෙවිය යුතු යම් මුදලක් වෙතොත් එම සම්පූර්ණ මුදල ගෙවන බවටත් එකඟ වේ.

11. සේවය අසතුටුදායකවීම හෝ වෙනත් කරුණක් නිසා හෝ දෙපාර්ශවය අතර ඇතිවන ආරවුලකදී එහි බේරුම්කරු ලෙස නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කරනු ඇත .

12. සිසුන් මෙන්ම කාර්ය මණ්ඩලයටද කාරුණිකව හා ආචාරශීලිව කටයුතු කළ යුතුය.

ඉහත කී පළමු පර්ශවය වන කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පී.එන්.කේ.මලලසේකර යන අය සහ දෙවන පාර්ශවය වන ........................................................................................... ආයතනයෙහි සභාපති, ................................................අය වර්ෂ දෙදහස් දහඅටක් වූ ජනවාරි මස ....... දින කොළඹ 10, ඕල්කට් මාවතේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ දී අත්සන් තබන ලදී.

| | |
|---|---|
| ........................................ | ........................................ |
| පළමු පාර්ශවය | දෙවන පාර්ශවය |
| (අධ්‍යක්ෂ ජනරාල්) | (කොන්ත්‍රාත්කරු) |

සාක්ෂි :

| | |
|---|---|
| 01. ...................................... | 01. ....................................... |
| 02. ...................................... | 02. ....................................... |

<u>මිලගණන් ඉදිරිපත් කිරීමේ ඉල්ලුම් පත්‍රය</u>

සභාපති,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ 10

**<u>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණික වෘත්තිකයන් පුහුණු කිරීමේ ආයතනය සහ තෝරා ගන්නා ලද තාක්ෂණ /කාර්මික විද්‍යාල 26ක් සඳහා පෞද්ගලික ආරක්ෂක සේවා පවත්වාගෙන යාම සඳහා</u>**

**<u>ලංසු කැඳවීම - 2018</u>**

1. කොන්ත්‍රාත්කරුගේ නම හා තනතුර :

2. ආරක්ෂක සේවා සැපයීමේ ආයතනයේ නම :

3. ආරක්ෂක සේවා සැපයීමේ ව්‍යාපාර ලියාපදිංචි ස්ථානයේ ලිපිනය :

4. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපිනයන් සහ ජා.හැ. පත් අංක :

5. ව්‍යාපාර ස්ථානයේ දුරකථන අංකය :

6. 2017 වර්ෂයට වලංගු ව්‍යාපාර ලියාපදිංචි අංකය හා දිනය :
   (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)
7. ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමේ සහතිකය සහ වාර්ෂික බලපත්‍රය :
   (බලපත්‍රයේ පිටපත ඇමිණිය යුතුය)

8. ඉල්ලුම් කරන ආකාරයේ සේවාවන් පිළිබඳ විස්තර :
   (පසුගිය වසර 05 තුළ ඒ බව සනාථ කෙරෙන සහතික හෝ ලියකියවිලි මේ සමඟ ඉදිරිපත් කළ යුතුය)

9. දැනටමත් සේවා සපයමින් සිටින ආයතන ඇත්නම් ඒවායේ නම්, ලිපිනයන් හා දුරකථන අංක :
   (ලියවිලි වලින් සනාථ කළ යුතුය.)

10. සේවකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් ගෙවනවාද යන්න :
    (සනාථ කිරීම සඳහා අදාළ ලියකියවිලි ඇමිණිය යුතුය)

**11.** **ප්‍රසම්පාදන කොන්දේසි හා උපදෙස් කියවා තේරුම් ගැනීමෙන් පසු 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාල සීමාව සඳහා වැට් රහිතව රුපියල්............................. (RS………………………) මුදලකට ආරක්ෂක සේවාව පහත සඳහන් පරිදි සැපයීමට මෙයින් එකඟ වෙමි/වෙමු.**

- **ඇමුණුම 01 හි සඳහන් පරිදි මිලගණන් ඉදිරිපත් කරන්න**

| නිලය | සේවයේ යෙදවිය යුතු නිලධාරීන් ගණන | එක් වැඩ මුරයක් සඳහා(පැය 12)එක් නිලධාරියෙක් සඳහා ගෙවන මුදල (රු) | සියළුම නිලධාරින් සඳහා මසකට ගෙවන මුදල(රු) |
|---|---|---|---|
| ස්ථාන භාර නිලධාරී (OIC) | **03** | | |
| ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී (SSO) | **83** | | |
| කාන්තා ආරක්ෂක නිලධාරී (LSO) | **22** | | |
| **උප එකතුව (බදු රහිත)** | | | |
| **VAT(අදාළ නම්)** | | | |
| **සම්පූර්ණ එකතුව (මසකට බදු සහිත)** | | | |
| **සම්පූර්ණ එකතුව (වසරකට බදු සහිත)** | | | |

- මෙම ලංසු දින 90ක කාලයක් සඳහා වලංගු වේ.මෙම වලංගු කාලය තුළදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළහොත් ගිවිසුමකට එළඹීමටත් කාර්ය සාධන ඇපකරයක් ඉදිරිපත් කිරීමටත් සූදානමින් සිටිමි/සිටිමු.
- අවම ලංසු භාර ගැනීමට ඔබ බැදී නොසිටින බවත් , කිසිම හේතුවක් නොදන්වා ලංසු ප්‍රතික්ෂේප කිරීමට ඔබට අයිතියක් ඇති බවත් මම/අපි දැනගෙන සිටිමි./සිටිමු.

ඉහත දැක්වූ තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, අදාළ කොන්දේසි අඩංගු පත්‍රිකාව හොඳින් කියවා බලා ඒ අනුව කටයුතු කිරීමට එකඟ වන බවත් මෙයින් දන්වා සිටිමි.

දිනය :

කොන්ත්‍රාත්කරුගේ නම සහ අත්සන

මුද්‍රාව

සභාපති,ප්‍රසම්පාදන කමිටුව

.......................................................................................................................................................

කුවිතාන්සි අංකය:

නිකුත් කිරීමේ නිලධාරී:

ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවට

දිනය :

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණික වෘත්තිකයන් පුහුණු කිරීමේ ආයතනය සහ තෝරා ගන්නා ලද තාක්ෂණ /කාර්මික විද්‍යාල 26ක් සඳහා පෞද්ගලික ආරක්ෂක සේවා පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම.**

**සේවා සැපයුම් කරුවන්ට අදාළ උපදෙස් හා කොන්දේසි**

- උපදෙස්

**01.මිලගණන් ඉදිරිපත් කිරීම**

I. පිටපත් දෙකකින් යුක්තව සම්පූර්ණ කර අත්සන් තබන ලද ලංසු ආකෘති පත්‍ර, එක් පිටපතක් මුල් පිටපත ලෙසත්,අනෙක් පිටපත අනු පිටපත ලෙසත් නම් කර වෙන වෙනම කවරවල බහා ඉන් පසුව මුල් පිටපත හා අනු පිටපත වෙන් කර හඳුනා ගැනීමට හැකිවන ආකාරයට නම් කර කවර දෙකම එක කවරයක බහා ඉදිරිපත් කල යුතු ය.

II. කවරයේ වම් පස ඉහල කෙළවරේ " **ආරක්ෂක සේවා පවත්වාගෙන යාම සඳහා ලංසු ඉදිරිපත් කිරීම"**ලෙස සඳහන් කළ යුතු ය.

III. ලංසු පත් 2017 දෙසැම්බර් මස 06 දින පෙ.ව. 11.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් නො.557,ඕල්කොට් මාවත කොළඹ 10 හි පිහිටි කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය සේවා අංශයේ ඇති ලංසු පෙට්ටියේ බහාලිය යුතුය .

IV. 2017 දෙසැම්බර් මස 06 වෙනි දින පෙ.ව.11.00ට පසු ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබන අතර තැපෑලේදී සිදුවන ප්‍රමාදයන් ගැන අධ්‍යක්ෂ ජනරාල් කිසිදු වගකීමකට නොබැදේ.

**02.මිලගණන් විවෘත කිරීම**

2017 දෙසැම්බර් මස 06 වෙනි දින පෙ.ව.11.00ට ලංසුපත් භාර ගැනීම අවසන්වූ වහාම විවෘත කරනු ලැබේ. මේ සඳහා ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන්ට සහභාගි විය හැක. එම අවස්ථාවේදී සියළුම ලංසුපත්වල මිල උපලේඛනය කියවනු ලබන අතර , ලංසුකරුවන්ට එම මිලගණන් සටහන් කර ගත හැකි ය.

**03.ආරක්ෂක සේවාව සඳහා යෙදවිය යුතු ශ්‍රමිකයන්**

ඇමුණුම් අංක 01 හි දැක්වෙන පරිදි විය යුතුය.

**04.මිලගණන්වල වලංගු කාලය**

ලංසුපත්වල වලංගු කාලය ලංසුපත් භාරගන්නා අවසාන දිනයේ සිට දින 90ක් විය යුතු ය.

**05.කාර්ය සාධන ඇපකරය**

සේවා සැපයීම සඳහා තෝරාගත් ලංසුකරු එම ලිපිය ලැබීමෙන් සති 02ක් තුළ දී පිළිගත් බැංකුවකින් කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමෙන් 10% ක මුදලක කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කල යුතු ය.

**06.කොන්ත්‍රාත් මුදල**

කොන්ත්‍රාත්තුව සඳහා වැට් බදු අය කරන්නේනම් වැට් බදු අංකය සහිතව ලංසුවේ ශුද්ධ වටිනාකම සහ හිමිකම් ඉල්ලනු ලබන වැට් බද්දේ වටිනාකම වෙන වෙනම මිල ගණන් ඉල්ලුම් පත්‍රයේ ඇතුලත් කළ යුතු ය.

- **කොන්දේසි පත්‍රිකාව**

**(අ) ආරක්ෂක සේවාව යෙදවිය යුතු ප්‍රදේශයන්**

දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල පරිශ්‍රයට අයත්වන සියලු ම ස්ථානවන ප්‍රධාන කාර්යාලය හා පිහිටි ගොඩනැගිල්ලේ බිම් මහලේ සිට තෙවන මහල දක්වා මහල් ද (ගරාජය, රියදුරු කාමරය, ආරක්ෂක කුටිය, ආපන ශාලාව ද ඇතුළුව) නඩත්තු ඉංජිනේරු අංශය, ගබඩා අංශය පිහිටි පරිශ්‍රය සහ , අම්පාර,අනුරාධපුර,බදුල්ල,ගාල්ල,යාපනය,මහනුවර,කුරුණෑගල,මරදාන හා රත්නපුර යන තාක්ෂණ විද්‍යාල පරිශ්‍රයන් ද එම පරිශ්‍රයන්හි ඇති සියලුම නිශ්චල හා චංචල දේපල ද ඇඹිලිපිටිය,ආනමඩුව,බලපිටිය,බණ්ඩාරවෙල,මඩකලපුව,බෙලිඅත්ත,ගම්පහ,හෝමාගම,කළුතර, කෑගල්ල,කුලියාපිටිය,මන්නාරම,නුවරඑළිය,රත්මලාන,සම්මන්තුරේ,ත්‍රිකුණාමලය,හා මාතර යන කාර්මික විද්‍යාල පරිශ්‍රයන් එම පරිශ්‍රයන්හි ඇති සියලුම නිශ්චල හා චංචල දේපල ද අතිරේක සේවාවන් අවශ්‍ය වූ විට එම සේවාව සැපයීමට ද යටත්ව ඒවාට අයත් සියලු දේපල ද ඊට අමතරව ඒ ඒ විද්‍යාලයන්හි අධ්‍යක්ෂවරුන් සහ විදුහල්පතිවරුන් විසින් වෙසෙසින් පවරන ස්ථාන ද වේ.

**(ආ) ආරක්ෂක සේවාව යෙදවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු**

ආ.1. අදාළ භූමියට ඇතුළුවන පිටවන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇතුළු ඕනෑම කෙනෙකුගේ ගමන් මලු හා වෙනත් පාර්සල් අවශ්‍ය අවස්ථාවන්හිදී පරීක්ෂාවට ලක් කළ යුතුය.

ආ.2. කාර්යාලීය බෑගයට අමතරව කිසියම් විශේෂ යමක් රැගෙන යන්නේ නම් ආරක්ෂක නිලධාරීන් ඒ පිළිබඳව දැනුවත් විය යුතුය.

ආ.3. කාර්යාල භූමියට ඇතුළු වන හා පිටවන සියලුම වාහන පිළිබඳව අංක සහිතව ලේඛණයක් පවත්වා ගෙන යායුතුය.

ආ.3.1. එම වාහනවලට සම්බන්ධ රියදුරුගේ නම/ආයතනය සහිතව අනන්‍යතාවය තහවුරු විය යුතුය.

**(ඇ) ආරක්ෂක සේවයේ යෙදවීම පිළිබඳව පොදු කොන්දේසි**

ඇ.1. දවසේ පැය 24 තුල ම ආරක්ෂක සේවාවන් ඉටු කළ යුතුය.

ඇ.2. සේවා කාලය සේවා මුර දෙකකින් ක්‍රියාත්මක කළ යුතුය.

I. පෙ.ව.7.00 සිට ප.ව.7.00 දක්වා හා

II. ප.ව.7.00 සිට පෙ.ව.7.00 දක්වා

එය එසේ වුව ද කාන්තා ආරක්ෂක නිලධාරීන් සඳහා සේවා මුරය පෙ.ව.7.00 සිට ප.ව.5.30 දක්වා අවම වශයෙන් දිනකට පැය 10½ක ලෙස සේවා මුරය ක්‍රියාත්මක වන අතර එය සේවා මුරයක් ලෙස සලකා ගෙවීම් සිදුකරනු ඇත.

ඇ.3. සේවයේ යොදවා ගන්නන් නිරන්තරයෙන් වෙනස් නොකළ යුතු අතර, අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී එක් එක් දිනයන්හි සේවයේ යොදවන ලද සේවකයින්ගේ අනන්‍යතාවය (නම, ලිපිනය ආදී විස්තර) ඉදිරිපත් කිරීමට සේවා සැපයුම් ආයතනයට හැකි විය යුතුය.

ඇ.4. ආරක්ෂක සේවයේ යොදවන්නන්ගේ හෝ වෙනත් පුද්ගලයකු පිළිබඳව කම්කරු වන්දි ආඥා පනත හෝ වෙනත් කම්කරු නීතියක් යටතේ වූ කිසිදු හිමිකමකට පළමු පක්ෂයට බැඳුණු මෙම දෙපාර්තමේන්තුවේ බැඳීමක් නැත. යොදවන ලද සේවකයින්ට අදාලව ගෙවන අර්ථසාධක අරමුදලින් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලින් ගෙවීම් පිළිබඳ සියළු වගකීම් ආරක්ෂක සේවා සපයන ආයතනය විසින් දැරිය යුතුය. සේවයේ යොදවන සියලු සේවකයන්ගේ සේවා යෝජකයා වශයෙන් ඇති සියලු බැඳීම් හා වගකීම් ආරක්ෂක සේවය පවත්වාගෙන යන ආයතනය විසින් වග බලාගත යුතුය.

ඇ.5. ලංසු පත්‍රය සමග ඉදිරිපත් කරන ලද සේවයේ යෙදවීමට බලාපොරොත්තු වන සේවකයන්ගේ අනන්‍යතාවය තහවුරු කරන ජාතික හැඳුනුම්පත් අංකය, නම හා ලිපිනය සඳහන් ලැයිස්තුවේ පසුව යම් වෙනසක් සිදු කිරීමට අවශ්‍ය වෙතොත් මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

ඇ.6. ආරක්ෂක සේවය ඉටු කරන්නන් දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ හෝ අදාළ තාක්ෂණ / කාර්මික විද්‍යාලවල සිසුන්ගේ අධ්‍යයන කටයුතුවලට සහ කාර්යාලයේ හා ආචාර්ය මණ්ඩලයේ හෝ සේවකයකුගේ රාජකාරියට බාධාවක් නොවන අයුරින් ආරක්ෂක කටයුතු සිදු කළ යුතුය.

ඇ.7. ආරක්ෂක සේවකයන්ගේ නොසැලකිල්ල හෝ අතපසුවීම් හේතුවෙන් රජයේ දේපලකට හෝ දෙපාර්තමේන්තු නිලධාරියෙකු හෝ සේවකයකු හට යම් අලාභ හානියක් හෝ පාඩුවක් සිදුවුව හොත් ඒ පිළිබඳ වගකීම දෙවන පාර්ශවය වන එම ආයතනය විසින් දැරිය යුතුය.

ඇ.8. මෙම කොන්දේසිවලට අමතරව රජය විසින් හා/හෝ කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රජය වෙනුවෙන් වරින්වර පවරනු ලබන කොන්දේසි වලට දෙවන පාර්ශවය එකඟ විය යුතුය.

ඇ.9. පළමු පාර්ශවයට බැඳුණ දෙපාර්තමේන්තුව විසින් දෙවන පාර්ශවයෙන් ඉටුකරවා ගැනීමට අපේක්ෂිත සේවාවලට අයත් යම් සේවාවක් හෝ කොටසක් යම් අවස්ථාවකදී නිසි පරිදි ඉටු කර නොමැති බැව් පෙනී ගියහොත් ඒ සෑම අතපසු වූ අවස්ථාවක් හෝ දිනයක් සඳහාම ආරක්ෂක සේවය සපයන ආයතනය වෙත ගෙවන මාසික මුදලින් <u>සියයට පහක(5%)</u>ද අඩු කිරීමට යටත් කරනු ඇත.

ඇ.10. ගිවිසගත් සේවාව පැහැර හරින බැව් පෙනී ගිය හොත් කොන්ත්‍රාත්තුව වහාම අවලංගු කිරීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

ඇ.11 ආරක්ෂක නිලධාරීන්ගේ එක් සේවා මුරයක් පැය 12 කට සීමා විය යුතු අතර ම අඛණ්ඩව පැය 24 ක් ලෙස සේවයේ නොයෙදවිය යුතුය. එසේ සේවයේ යොදවා තිබුණහොත් සෑම පැය 12 ට පසු සේවා මුරය සඳහා ගෙවීම් සිදු කරනු නොලැබේ.

ඇ.12 බාල වයස්කරුවන් සේවයේ නොයෙදවිය යුතු අතර සේවයේ යොදවන්නන් අවුරුදු 65ට අඩු මනා ශරීර සෞඛ්‍යයෙන් යුතු අය විය යුතුය.

**(ඇ) ගෙවීම් කටයුතු**

ඇ.1. ඉහත සඳහන් කර ඇති සියලු සේවාවන් වෙනුවෙන් මාසිකව දෙවන පාර්ශව විසින් අය කරනු ලබන මුදල මාසික මිල ගණන් වශයෙන්ඉදිරිපත් කළ යුතු අතර, සේවාව පවරනුයේ 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා වන අතර, එකී කාල පරිච්ඡේදය තුළ ගිවිසුම්ගත මුදලෙහි වෙනසක් සිදු නොවිය යුතුය.

ඇ.2. මාසයක් සේවය ඉටු කළ වහාම අදාළ ගෙවීම් කටයුතු සඳහා දෙවන පාර්ශවය විසින් අදාළ ලියකියවිලි සහිත බිල්පත ඉදිරිපත් කළ යුතුය. එකී බිල්පත ලංසුවෙන් ඉදිරිපත් කළ මිල ගණන්වලට අනුකූල විය යුතුය. ගෙවීම් කිරීමට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් මාසයේ සේවාව නිසි අයුරින් ඉටු කරන ලද බවට සහතික කර තිබිය යුතුය.

ඇ.3. යම් ස්ථානයක නියමිත ආරක්ෂක නිලධාරීන් සේවයෙහි නොසිටියේ නම් ඒ සඳහා වූ මුදල මාසික ගෙවීම්වලින් අඩුකර ගෙවනු ලැබේ.

ඇ.4. ගිවිසුමෙන් දක්වන ලද සේවාවන් යම් දිනකදී දෙවන පාර්ශවය විසින් සතුටුදායක ලෙස නිම කිරීමට අපොහොසත් වුවහොත් එකී සෑම දිනයක් සඳහාම මාසික ගාස්තුව ගෙවීමේදී සියයට පහක (5%) මුදලක් අඩු කරනු ලැබේ.

ඇ.5. ඉහත ඇ.11 පරිදි එක දිගට සේවයේ යෙදී තිබුණහොත් පැය 12 කට පසු එක් සේවා මුරයක් සඳහා ගෙවීම් සිදු කරනු නොලැබේ.

ඇ.6. ඉදිරිපත් කර ඇති මිලගණන් අනුව කොළඹින් බැහැර ප්‍රදේශ සඳහා වූ පරිපාලන ගාස්තුවද එකතුකොට ගෙවනු ඇත.

ඇ.7. පිරිමි ආරක්ෂක නිලධාරියෙකු තම සේවා තම සේවා මුරය සඳහා පැය 12 ට අඩුවෙන් සේවය කර ඇත්නම් දෛනික දීමනාව අනුව අදාල කාලයට ගැලපෙන්නා වූ ප්‍රමාණයට ගෙවීම්වලින් අඩුකරනු ලබන අතර, කාන්තා ආරක්ෂක නිලධාරිනියක තම සේවා මුරය සඳහා පැය 10 ½ ට අඩුවෙන් සේවය කර ඇත්නම් දෛනික දීමනාව අනුව අදාල කාලයට ගැලපෙන්නා වූ ප්‍රමාණයට ගෙවීම්වලින් අඩුකරනු ඇත.

සභාපති,ප්‍රසම්පාදන කමිටුව

..............................................................................................................................................

කුවිතාන්සි අංකය:
නිකුත් කිරීමේ නිලධාරී: ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවට
දිනය :

ඇමුණුම 01

**එක් එක් ආයතන සඳහා අවශ්‍ය ආරක්ෂක නිලධාරි /නිලධාරිනියන් සංඛ්‍යාවේ ආකෘතිය - 2018**

| | | | O I C | S S O | L S O | Total |
|---|---|---|---|---|---|---|
| | ආයතනය | | | | | |
| **01** | දෙපාර්තමේන්තු පරිශ්‍රය | | 1 | 6 | 1 | 8 |
| **02** | තාක්ෂණික වෘත්තිකයන් පුහුණු කිරීමේ ආයතනය | | 1 | 3 | 1 | 5 |
| **03** | තාක්ෂණ විද්‍යාල | | | | | |
| | 1 | අම්පාර | | 4 | 1 | 5 |
| | 2 | අනුරාධපුරය | | 4 | 1 | 5 |
| | 3 | බදුල්ල | | 4 | 1 | 5 |
| | 4 | ගාල්ල | | 4 | 1 | 5 |
| | 5 | යාපනය | | 3 | 1 | 4 |
| | 6 | මහනුවර | | 4 | 1 | 5 |
| | 7 | කුරුණෑගල | | 4 | 1 | 5 |
| | 8 | මරදාන | | 4 | 1 | 5 |
| | 9 | රත්නපුර | | 4 | 1 | 5 |
| **04** | කාර්මික විද්‍යාල | | | | | |
| | 1 | ඇඹිලිපිටිය | | 3 | 1 | 4 |
| | 2 | ආනමඩුව | | 2 | 1 | 3 |
| | 3 | බලපිටිය | | 3 | 0 | 3 |
| | 4 | බණ්ඩාරවෙල | | 1 | 0 | 1 |
| | 5 | මඩකලපුව | | 3 | 1 | 4 |
| | 6 | බෙලිඅත්ත | | 2 | 0 | 2 |
| | 7 | ගම්පහ | | 3 | 1 | 4 |
| | 8 | හෝමාගම | | 1 | 1 | 2 |
| | 9 | කළුතර | | 3 | 1 | 4 |
| | 10 | කෑගල්ල | | 4 | 0 | 4 |
| | 11 | කුලියාපිටිය | 1 | 4 | 1 | 6 |
| | 12 | මන්නාරම | | 3 | 1 | 4 |
| | 13 | නුවරඑළිය | | 3 | 1 | 4 |
| | 14 | රත්මලාන | | 4 | 1 | 5 |
| | 15 | සම්මන්තුරේ | | 1 | 0 | 1 |
| | 16 | ත්‍රිකුණාමලය | | 1 | 1 | 2 |
| | 17 | මාතර | | 1 | 0 | 1 |
| | | **Total** | **3** | **83** | **22** | **108** |

**සේවා මුර සඳහා නිලධාරින් යෙදවීමේ ආකෘතිය**

| | තාක්ෂණ විද්‍යාල | | කාර්මික විද්‍යාල | |
|---|---|---|---|---|
| | SSO | LSO | SSO | LSO |
| දිවා සේවා මුරය | 2 | 1 | 1 | 1 |
| රාත්‍රී සේවා මුරය | 2 | | 2 | |

- **එක් සේවා මුරයක් සඳහා උපරිම කාල සීමාව පැය 12ක් විය යුතුය.**

DTET/14/01/06/03/2018 2017.11.

කළමනාකරු,

..........................................

**<u>2018 වර්ෂයට ආරක්ෂක සේවය ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

මෙම දෙපාර්තමේන්තුවවේ ප්‍රධාන කාර්යාලය,දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණික වෘත්තිකයන් පුහුණු කිරීමේ ආයතනය, තාක්ෂණ විද්‍යාල 09ක් හා කාර්මික විද්‍යාල 17ක් සඳහා 2018 වර්ෂයට පෞද්ගලික ආරක්ෂක සේවය සැපයීම වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

02. අවශ්‍ය වන්නාවූ ආරක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් සංඛ්‍යාව පිළිබඳ විස්තර හා සේවා මුරය පිළිබඳ කොන්දේසි සහිත උප ලේඛන මේ සමඟ අමුණා ඇත.

03. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සියළුම පරිශ්‍රයන් සඳහා මිලගණන් ඉදිරිපත් කළ යුතු අතර මුද්‍රා තැබූ මිලගණන් 2017.12.06. දින පෙ.ව.11.00ට පෙර අධ්‍යක්ෂ (තාක්ෂණික සහාය සේවා)වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ තාක්ෂණික සහාය සේවා අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

04. ආපසු නොගෙවන රු.1000/= ක් හා ආපසු ගෙවනු ලබන රු.100,000.00ක් වූ ටෙන්ඩර් තැන්පතු මුදලක් ගෙවා 2017.11.04. දින දක්වා සතියේ ඕනෑම වැඩකරන දිනයක පෙ.ව.9.00 සිට ප.ව. 2.45 දක්වා අතර කාලය තුළ දී මෙම දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා අදාළ රිසිට්පත තාක්ෂණික සහාය සේවා අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අදාළ ටෙන්ඩර් ලියවිලි ලබාගත හැකි අතර එහි ඇති ඉල්ලුම් පත්‍රය මඟින් පමණක් මිලගණන් ඉදිරිපත් කළ යුතු ය.

**අධ්‍යක්ෂ(තාක්ෂණික සහාය සේවා),**
**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ.557, ඕල්කට් මාවත,කොළඹ 10.**
**දුරකථන අංකය : 011-2424977**
**ෆැක්ස් අංකය : 011-2424977**

**ජී.ප්‍රීති විජේසිංහ,**
අධ්‍යක්ෂ(තාක්ෂණික සහාය සේවා)(වැ.ආ),
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට